15 MAY 1987
අනුරාධපුරයේ.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1987 අංක 12 දරන
# ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 24 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1987 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 24 වන දින.]

එල්. ඩී.—ඕ. 25/86

**ගොවීන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, එම යෝජනාක්‍රමය, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් මෙහෙයවනු ලැබීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය පිහිටුවීම

**2.** (මෙහි මින් මතු "යෝජනාක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයක්, මේ පනතේ විධිවිධානවලට අනුකූල ව පිහිටුවනු ලැබිය යුතු ය. ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිහිටුවීම.

**3.** අමාත්‍යවරයා විසින් යෝජනාක්‍රමය පරිපාලනය කිරීමේ හැකියාව කෙරෙහි සැලකිලිමත් ව සහ යම් වගා ක්‍රමයක වෘත්තීය අවදානම පිළිබඳව සැලකිලිමත් ව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්— යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රදේශය සහ දායක මුදල් ගෙවීමට හිමිකම් ලබන ගොවීන්ගේ වර්ග සහ සුදුසුකම් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

(අ) යෝජනාක්‍රමය ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශය ;

(ආ) යෝජනාක්‍රමයට දායක මුදල් ගෙවීමට හිමිකම් ලබන ගොවීන්ගේ වර්ග ; සහ

(ඇ) යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීමට හිමිකම් ලබන ගොවීන්ගේ සුදුසුකම්

තීරණය කරනු ලැබිය හැකි ය.

ජ 094669—8,.00 (87/01)

**යෝජනා ක්‍රමයට බැඳීම සඳහා සුදුසුකම්.**

4. නියමිත සුදුසුකම් සපුරන්නා වූ ද වයසින් අවුරුදු දහඅටට අඩු නොවූ සහ අවුරුදු පනස් නවයට වැඩි නොවූ යම් ගොවියකුට, මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම ඇත.

**යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ.**

5. (1) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන්නා වූ (මෙහි මින් මතු "දායක" යනුවෙන් සඳහන් කරනු ලබන) ගොවියකු, නියෝග මගින් නියම කරනු ලබන පදනමක් මත, මේ යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතු ය :—

(අ) නියම කරනු ලැබිය හැකි පරිදි කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් ;

(ආ) ස්ථිර අර්ධ අබලතාවක් සම්බන්ධයෙන් වූ විට එක්වර ගෙවන මුදලක පාරිතෝෂිකයක් හෝ, විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතු වන අවස්ථාවේ විශ්‍රාම වැටුපක් ;

(ඇ) ස්ථිර පූර්ණ අබලතාවක් සම්බන්ධයෙන් වූ විට, එක් වර ගෙවන මුදලක පාරිතෝෂිකයක් හෝ කාලපරිච්ඡේද අනුව දීමනාවක් ; හෝ

(ඈ) මරණ පාරිතෝෂිකයක්.

(2) වෙනත් කරුණු අතර, දායකත්වයේ කාල සීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන, විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ගෙවීමේ පදනම නියම කරනු ලැබිය යුතු ය.

**විශ්‍රාම වැටුප ගෙවිය යුතු අවස්ථාව.**

6. (1) දායකයකු තම වයස අවුරුදු හැට වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය. එසේ වුව ද, තම වයස අවුරුදු පනස් පහ වූ පසුව දායක මුදල් ගෙවීම ආරම්භ කළ දායකයකු, නියම කරනු ලබන ඔහුගේ මුළු දායක මුදල් ප්‍රමාණය ගෙවීමෙන් පසුව සහ යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට අවුරුදු පහක් අවසාන වීමේ දී පමණක් විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය.

(2) දායකයා මිය යන මාසයේ අවසානය දක්වා විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතු ය.

**දායක මුදල මත ප්‍රතිදානය.**

7. කෘෂිකර්ම රක්ෂණය දිරිගැන්වීම ගැන සැලකිල්ලෙන් යුතුව අමාත්‍යවරයා විසින්, දායකයකු විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් මත ප්‍රතිදානයක් හෝ වට්ටමක් නියම කරනු ලැබිය හැකි ය.

**අර්ධ ලෙස අබලවීම.**

8. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර ස්ථිරව හා අර්ධ ලෙස අබල වූ යම් දායකයකු විසින් යෝජනා ක්‍රමය යටතේ නියම කරනු ලබන අබලතා පාරිතෝෂිකය ලබාගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත්වීම හෝ තවදුරටත් දායක මුදල් නොගෙවමින්, යෝජනා ක්‍රමයෙහි රැඳී සිට විශ්‍රාම වැටුප ලැබිය යුතු වන අවස්ථාවේ එය ලබා ගැනීම හෝ, සිය මනාපය පරිදි, කරනු ලැබිය යුතු ය.

9. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර ස්ථිරව හා පූර්ණ ලෙස අබල වූ යම් දායකයකු විසින් යෝජනා ක්‍රමය යටතේ නියම කරනු ලබන අබලතා පාරිතෝෂිකය ලබා ගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත්වීම හෝ යෝජනා ක්‍රමය යටතේ නියම කරනු ලබන අබලතා දීමනාව, ජීවිත කාලය පුරා ලබා ගනිමින් තවදුරටත් දායක මුදල් නොගෙවා යෝජනා ක්‍රමයෙහි රැදී සිටීම හෝ සිය විනාපය පරිදි කරනු ලැබිය යුතු ය.

*පූර්ණ ලෙස අබලවීම.*

10. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දායකයකු මියගිය විට, නියම කරනු ලබන පදනමක් මත, ජීවත්ව සිටින භාර්යාවට හෝ ස්වාමිපුරුෂයාට හෝ එවැනි භාර්යාවක හෝ ස්වාමිපුරුෂයකු නොමැති විට, මේ පනතේ උපලේඛනයේ ප්‍රමුඛතා අනුපිළිවෙළින් ඒ දායකයාගේ ලේ ඥාතීන්ගෙන් එක් අයකුට දමණක් හෝ මරණ පාරිතෝෂිකයක් ගෙවනු ලැබිය යුතු ය. යම් ගණයක එක් ඥාතියකුට වැඩියෙන් සිටින අවස්ථාවක, වයසින් වැඩි තැනැත්තාට ප්‍රමුඛත්වය දිය යුතු ය.

*මරණ පාරිතෝෂිකය.*

## II වන කොටස

### යෝජනාක්‍රමය පාලනය කිරීම

11. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් මෙම යෝජනා ක්‍රමය මෙහෙයවනු ලැබිය යුතු ය.

*කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් යෝජනාක්‍රමය මෙහෙයවනු ලැබිය යුතු බව.*

12. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනතින්, මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අතිරේක ව මණ්ඩලයට පහත දැක්වෙන බලතල, කර්තව්‍ය සහ කාර්ය තිබිය යුතු ය :—

*මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.*

(අ) යෝජනාක්‍රමයට අදාළව මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ආ) යෝජනාක්‍රමයට අදාළ යම් කාරණයක්, උපදේශක කාරක සභාව වෙත උපදෙස් සඳහා යොමු කිරීම ;

(ඇ) යෝජනාක්‍රමය සම්බන්ධයෙන් අවශ්‍ය ජීවගණක, මූල්‍ය සහ මෙහෙයවීම් වාර්තා පවත්වාගෙන යාම ;

(ඈ) යෝජනාක්‍රමය පිළිබඳව සමීක්ෂණ, ඇගැයුම් හා සමාලෝචන කර, අවශ්‍ය ව ද මණ්ඩලයට බලය ඇත්තා වූ ද අවස්ථාවල දී මෙහෙයවීම් රීතිවල වෙනස්කම් ඇති කිරීම :

(ඉ) යම් දායකයකු වෙත නිකුත් කරන ලද සහතිකය ප්‍රකාර, ඔහු වෙත කළ යුතු ප්‍රදානය තීරණය කිරීම ;

(ඊ) යෝජනාක්‍රමය කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා අවශ්‍ය නිලධරයන්, සේවකයන් සහ වෙනත් සේවානියුක්තයන් සේවයෙහි යොදවා ගැනීම ; සහ

(ඩ) යෝජනාක්‍රමය මෙහෙයවීම සහ පාලනය කිරීම පහසු කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු දේවල් කිරීම.

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පැවරීම.

13. (1) මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය කිසිවක්, මණ්ඩලය විසින්, මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට හෝ මණ්ඩලයේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් පවරනු ලැබ සිටින සභාපතිවරයා, සාමාජිකයා හෝ නිලධරයා විසින්, මණ්ඩලයේ සාමාන්‍ය විධානයට යටත් ව, එම බලතල පාවිච්චි කිරීම, කර්තව්‍යයන් කිරීම සහ කාර්ය ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

සෑම දායකයකු වෙත, මණ්ඩලය විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු බව.

14. යම් තැනැත්තකු දායකයකු ලෙස බඳවා ගනු ලැබූ විට මණ්ඩලය විසින් ඔහු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එහි ඔහු විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල, සහතිකයේ නියමයන් සහ කොන්දේසි සහ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ ඔහුට හිමි වන ප්‍රතිලාභ සඳහන්ව තිබිය යුතු ය.

සහතිකය අහිමිවීම.

15. (1) දායකයකු විසින් දායක මුදල ගෙවනු ලැබිය යුත්තේ යම් දිනයකට පෙර ද, ඒ දිනය සහතිකයෙහි නිශ්චය වශයෙන් දක්වා තිබිය යුතු අතර, පිළිවෙළින් වාරික පහක් ගෙවීම පැහැර හරින යම් දායකයකුට, ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි විය යුතු ය.

(2) යම් දායකයකු වෙත නිකුත් කර ඇති සහතිකය යටතේ ප්‍රතිලාභ යම් දායකයකුට අහිමි වී ඇති අවස්ථාවක, ඒ බවට දැන්වීමක් මණ්ඩලය විසින් ඒ දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත අභියාචනයක් කිරීමේ අයිතිය දායකයකුට තිබිය යුතු අතර, වාරික ගෙවීමට අපොහොසත් වීමේ හේතු දායකයාට පාලනය කළ නොහැකි වූ ඒවා බවට මණ්ඩලය සෑහීමට පත් වුවහොත් මණ්ඩලය විසින් සහතිකය වලංගු කරනු ලැබිය යුතු ය.

(4) සහතිකයක් වලංගු කිරීමට මණ්ඩලය තීරණය කරන අවස්ථාවක, හිඟ වාරික මුදල් ගෙවිය යුත්තේ යම් දිනයකට පෙර ද ඒ දිනය, දායකයා වෙත දැන්විය යුතු ය. එළි ගෙවීම කරන දිනය, සහතිකය වලංගුවීමේ දිනය විය යුතු ය.

(5) මණ්ඩලයේ තීරණයෙන් අතෘප්තියට පත් යම් දායකයකුට අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමේ අයිතිය තිබිය යුතු අතර, ඒ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

**16.** යම් දායකයකුට යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ප්‍රදානය කිරීම, යෝජනා ක්‍රමයට අනුකූලව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය. *ප්‍රදානය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු බව.*

**17.** යම් ඉඩමක අයිතිය, යම් ඉඩමක් වගා කිරීමට හිමිකම ඇති තැනැත්තා හෝ යම් ඉඩමක වගා කළ බෝග වර්ගය නිශ්චය කිරීමේ නැතහොත් යෝජනාක්‍රමයට දායකයකු වීමට යම් දායකයකුගේ ඇති සුදුසුකම සම්බන්ධයෙන් ඒ දායකයා විසින් සපයන ලද විස්තර සහ වැරදි බැලීමේ කාර්ය සඳහා මණ්ඩලයේ සභාපතිවරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දෙන ලද මණ්ඩලයේ යම් නිලධරයකු විසින්, දවසේ ඕනෑම වේලාවක දී, යම් ඉඩමකට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය. *ඉඩම් පරීක්ෂා කිරීම.*

**18.** (1) මණ්ඩලය විසින් තීරණය කරන ලද ප්‍රදානයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවූ යම් දායකයකු විසින්, එම ප්‍රදානය පිළිබඳ දැන්වීම ලැබී දින තිහක් ඇතුළත දී, තම අභියාචනයට හේතුව සඳහන් කරමින්, අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය. *අභියාචනය.*

(2) එවැනි අභියාචනයක් පිළිබඳව අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

**19.** යෝජනා ක්‍රමයෙන් ගෙවනු ලැබිය හැකි කිසිම විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක්, පවරා දීම හෝ අන්සතු කිරීම නොකළ යුතු අතර, සෑම පවරාදීමක් හෝ අන්සතු කිරීමක් සම්පූර්ණයෙන් ම ශූන්‍ය, අවලංගු හා බලරහිත වන්නේ ය. විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ දීමනාව හෝ ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හෝ සම්බන්ධයෙන් එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දීමනාවක් තහනමට ගැනීම හෝ ඊට ආඥා ක්‍රියාත්මක කිරීමෙන් අයකර ගැනීම හෝ කරනු නොලැබිය යුතු ය. *විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව, පවරාදීම හෝ ඉන් අයකර ගැනීම හෝ නොකළ යුතු බව.*

## III වන කොටස

### උපදේශක කාරක සභාව

**20.** පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත, (මෙහි මින් මතු "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) උපදේශක කාරක සභාවක් විය යුතුය :— *උපදේශක කාරක සභාව.*

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හය දෙනෙක්, එනම්—

(i) කාරක සභාවේ සභාපතිවරයා විය යුතු කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ;

(ii) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(iii) ගොවිජන සේවා කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(iv) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන ජීවගණකවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරීවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(vi) කම්කරු කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයා.

(ආ) පහත දැක්වෙන ආකාරයට නම් කරනු ලැබූ නම්කළ සාමාජිකයන් සය දෙනෙක්, එනම්:—

(i) කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ii) මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයෙන් පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(iii) කෘෂිකර්ම රක්ෂණ විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ;

(iv) සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පිළිබඳව පුළුල් දැනීමක් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන එක් සාමාජිකයෙක්.

*උපදේශක කාරක සභාවේ සාමාජිකයන්ගේ නුසුදුසුකම් සහ ධුර කාලය.*

**21.** (1) යම් තැනැත්තකු කාරක සභාවේ සාමාජිකයකු ලෙස නම් කරනු ලැබීමට හෝ කාරක සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කිරීමට—

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් ; හෝ

(ආ) එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු විසින් තම කාර්යයන් ඉටු කරනු ලැබීම කෙරේ හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මුදල් පිළිබඳ හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත් නම්

ඔහු නුසුදුස්සකු විය යුතු ය.

(2) කාරක සභාවේ සෑම නම්කළ සාමාජිකයකු ම, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කරනහොත් මිස, අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(3) කාරක සභාවේ නම්කළ සාමාජිකයකු ඉහත දැක්වෙන පරිදි කලින් ධුරය හිස් කරන අවස්ථාවක 20(ආ) වන වගන්තියේ විධිවිධාන ගැන සැලකිලිමත් ව, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත්

තැනැත්තකු නම් කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයා, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකුගේ ධුරයට ද, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(4) යම් හේතුවක් නිසා, සභාපතිවරයාට තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වේ නම්, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස තත් කාලයෙහි වැඩ බලන තැනැත්තා, කාරක සභාවේ සභාපතිවරයා ලෙස වැඩ බැලිය යුතු අතර, ඔහු එසේ වැඩ බලන කාලයේ දී ඔහු කාරක සභාවේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, කාරක සභාවේ යම් නම්කළ සාමාජිකයකුට තම කර්තව්‍යයන් කිරීමට නොහැකි වුවහොත්, ඔහු වෙනුවට වැඩ බැලීම පිණිස වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(6) කාරක සභාවේ යම් සාමාජිකයකු ඉවත් කිරීම අවශ්‍යානුකූල යයි අමාත්‍යවරයා සිතයි නම්, ඔහු විසින් ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා, ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(7) කාරක සභාවේ නම් කරන ලද යම් සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නොවන, ධුරය හිස් කරන කාරක සභාවේ යම් සාමාජිකයෙක්, නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

**22.** කාරක සභාව විසින් පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :— කාරක සභාවේ බලතල.

(අ) මණ්ඩලය විසින් කාරක සභාවට කලින් කල යොමු කරනු ලැබිය හැකි, යෝජනාක්‍රමය කළමනාකරණය කිරීමට, මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම ;

(ආ) මණ්ඩලයේ රීති සෑදීමට අදාළව මණ්ඩලයට උපදෙස් දීම ;

(ඇ) යෝජනා ක්‍රමය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, මෙහෙයවීම සහ ක්‍රියාවේ යෙදවීම සඳහා යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපත්ති සකස් කිරීම ;

(ඈ) යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම, මෙහෙයවීම සහ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් මණ්ඩලයේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම ; සහ

(ඉ) යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම, මෙහෙයවීම සහ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

**කාරක සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.**

23. කාරක සභාවේ රැස්වීම්වලට සහභාගිවීම සඳහා කාරක සභාවේ සාමාජිකයන්ට, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකි ය. කාරක සභාවේ කටයුතුවලට සම්බන්ධ කාර්යයන් සඳහා සාමාජිකයන් විසින් දරනු ලැබිය හැකි ගමන්, හෝටල් සහ වෙනත් වියදම් මණ්ඩලය විසින් ඒ සාමාජිකයන් වෙත ප්‍රතිපූරණය කළ යුතු ය.

**කාරක සභා වට අදාළව අමාත්‍යවරයාගේ බලතල.**

24. කාරක සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, කාරක සභාව විසින් ඒ විධාන අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදල

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදල.**

25. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එම අරමුදල වෙත—

(අ) යෝජනා ක්‍රමය මෙහෙයවීම සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන් ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත අත්තිකාරම් වශයෙන් දෙනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ඇ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්යයන් ඉටු කිරීමේ දී සහ කර්තව්‍යයන් කිරීමේ දී මණ්ඩලය වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඈ) යෝජනා ක්‍රමයේ දායකයන් විසින් දායක මුදල් වශයෙන් යෝජනා ක්‍රමය වෙත ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඉ) අරමුදල වෙන ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් යම් සම්භවයකින් ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ඊ) ආයෝජන වලින් පොලිය හෝ ලාභ හෝ වශයෙන් උපයා ගන්නා ලද සියලු මුදල් ප්‍රමාණයන්

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ කාරක සභාවේ සහ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්යයන් ඉටු කිරීමේ දී සහ කර්තව්‍යයන් කිරීමේ දී කාරක සභාව විසින් හෝ මණ්ඩලය විසින් හෝ දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් ප්‍රමාණයන් ද, මේ පනත මගින් හෝ එය යටතේ හෝ අරමුදලින් ගෙවිය යුතු වන මුදල් ප්‍රමාණයන් ද අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

26. මේ පනත යටතේ මණ්ඩලයට වහා අවශ්‍ය නොවන්නා වූ අරමුදලේ සියලු මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් බලය දෙනු ලබන ආකාරයට එසේ බලය දෙනු ලබන සුරැකුම්පත්වල මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය. මුදල් ආයෝජනය කිරීම.

27. (1) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ එවැනිම එකඟත්වය ඇතිව දෙන ලද යම් පොදු බලය දීමක නියමයන්ට අනුකූලව හෝ, මණ්ඩලයේ බැඳීම් ඉටු කිරීම සඳහා නැතහොත් මේ පනත යටතේ යෝජනා ක්‍රමයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීම සඳහා මණ්ඩලයට අවශ්‍ය වන්නා වූ මුදල් බැංකු අයිරා වශයෙන් හෝ අන් ලෙසකින් ණයට ගැනීම හෝ සාකච්ඡා කර ණය නියමයන් මත ලබා ගැනීම හෝ කරනු ලැබිය හැකි ය: මණ්ඩලයේ ණයට ගැනීමේ බලතල.

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ණය සම්බන්ධයෙන් යම් අවස්ථාවක දී පියවීමට ඉතිරිව ඇති මුළු මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය නොඉක්ම විය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව මණ්ඩලය විසින්, පහත දැක්වෙන කාර්යයන් සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සඳහා (1) වන උපවගන්තිය යටතේ වූ ණයක් නොවන ආකාරයෙන් මුදල් ණයට ලබා ගත හැකි ය:—

(අ) මණ්ඩලයේ පාවිච්චිය සඳහා අවශ්‍ය චංචල හෝ නිශ්චල දේපළක සන්තකය ලබා ගැනීමට හෝ ඒ දේපළ අත්කර ගැනීමට ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ලබා ගන්නා ලද යම් මුදලක් ආපසු ගෙවීමට.

28. (1) යෝජනා ක්‍රමයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය යනාදිය.

(2) මණ්ඩලය විසින්, එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට පැවති ආකාරයට, මණ්ඩලයේ පොත්පත් තුලනය කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, එකී දිනයට සැදී ඇති ආකාරයට යෝජනා ක්‍රමයේ ආදායම් හා වියදම් ගිණුමක් සහ වත්කම්වල සහ බැරකම්වල සාරාංශයක් අඩංගු ශේෂ පත්‍රයක් ඊළඟ අප්‍රේල් මාසයේ තිස් වන දිනට පෙර සකස් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය අත්සන් කිරීම මණ්ඩලය විසින් යෝජනා සම්මුතියකින් ඒ සඳහා බලය දෙනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයා විසින් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව, සෑම වර්ෂයකදී ම, යෝජනා ක්‍රමයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය කරුණු

නියෝග.

29. (1) (අ) යෝජනා ක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ආ) ගොවියකු යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලබන්නේ කවර සුදුසුකම්, කොන්දේසි සහ අවස්ථානුගත කරුණු ඇතිව සහ කවර සීමා කිරීම් යටතේ ද යන වග ;

(ඇ) දායකයන් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණය තීරණය කිරීම ;

(ඈ) දායකයන් වෙත විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ දීමනා ගෙවිය යුතු පදනම තීරණය කිරීම ;

(ඉ) දායක මුදල් ගෙවීම පැහැර හැරීම, සහතිකය ආපසු බාර දීම සහ දායකයකුගේ සුදුසුකම් නැතිවීම පාලනය කරන කොන්දේසි ;

(ඊ) මණ්ඩලයේ හෝ කාරක සභාවේ, කාර්ය පටිපාටිය සහ කටයුතු කර ගෙන යාම විධිමත් කිරීම ;

(උ) සහතිකය අවසන් කිරීම හෝ අහිමි කිරීම ; සහ

(ඌ) අර්ධ හෝ පූර්ණ අබලතාව තීරණය කිරීමේ පදනම්

ඇතුළුව නියම කෙරෙතැයි හෝ නියම කළ යුතු යයි මේ පනතෙහි සඳහන් කරුණු ද නියෝග සෑදීමට මේ පනතින් අවශ්‍ය කෙරෙන කරුණු ද සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය. එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ නියෝගයෙහි සඳහන් පසු දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) එවැනි සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, හැකි තාක් ඉක්මණින්, අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

30. (1) කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක්— මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ ගන්නා ලද පියවර සඳහා ආරක්ෂාව.

(අ) මණ්ඩලය හෝ කාරක සභාව හෝ විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට හෝ කාරක සභාවට හෝ විරුද්ධව; හෝ

(ආ) මණ්ඩලයේ හෝ කාරක සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ, මණ්ඩලයේ නිලධරයකු, සේවකයකු නැත හොත් අනුයෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ සද්භාව යෙන් කරන ලද හෝ එසේ අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට, සේව කයාට නැතහොත් අනුයෝජිතයාට විරුද්ධව

පැවරිය නොහැකි විය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව ගෙන එන ලද යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාව යෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරනහොත්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

31. මේ පනතේ යම් විධිවිධානයක් හෝ පනත යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් හෝ කඩ කරන්නා වූ නැත හොත් ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින්නා වූ සෑම තැනැත් තකු ම, වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයකට දෙයා කාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහස් පන් සියයක දඩයකට හෝ, ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. වැරදි.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් කෙරේ.

උපලේඛනය (10 වන වගන්තිය.)

ප්‍රමුඛතාව අනුව, ලේ ඥාතීන්ගේ අනු පිළිවෙල.

(1) පුත්‍රයෝ
(2) දියණියෝ
(3) මුනුබුරෝ
(4) මිනිබිරියෝ
(5) පියා
(6) මව
(7) සහෝදරයෝ
(8) සහෝදරියෝ
(9) පියාගේ හෝ මවගේ සහෝදරයෝ
(10) පියාගේ හෝ මවගේ සහෝදරියෝ
(11) බෑණලා
(12) ලේලිලා.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.